සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

කතෝලික ධර්මය I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

- ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති වරණ අතරින් දී ඇති නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

01. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලෝකය තුළ පෝෂණය වනුයේ,
(1) ක්‍රිස්තුවේදීය සම්ප්‍රදාය. (2) දේව වේදීය සම්ප්‍රදාය.
(3) ජීවන සභා සම්ප්‍රදාය. (4) ද්විතීය නීති සම්ප්‍රදාය.

02. ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ අපොස්තුළුවරු සුභ අස්න දේශනා කිරීම ආරම්භ කරන ලද්දේ,
(1) ජෙරුසලමෙන් ය. (2) ජුදයාවෙන් ය.
(3) සමාරියෙන් ය. (4) රෝමයෙන් ය.

03. නව ගිවිසුමේ හසුන්පත් වැඩි ප්‍රමාණයක කතුවරයා වන්නේ,
(1) ජොහාන් තුමා ය. (2) පාවුලු තුමා ය.
(3) පේදුරු තුමා ය. (4) ජාකෝබ්තුමා ය.

04. එපීස හා කොලොස්සි යන සංදේශ අයත් පොත් කාණ්ඩය වන්නේ,
(1) පාවුලුතුමා විසින් ම ලියන ලද සංදේශ (2) ආරූඪ කර්තෘත්වයේ සංදේශ
(3) සාමාන්‍ය සංදේශ (4) ද්විතීය පාවුලු සංදේශ

05. අප දිවියේ හමුවන බාධක ගැටලුවලට ඉවසීමෙන් මුහුණ දීමෙන් අවසානයේ ස්වර්ගීය සැපත ලබා ගත හැකි බව කියවෙන්නේ,
(1) ද්විත්වවාදයෙනි. (2) ප්‍රඥාවාදයෙනි.
(3) යුගාන්තවාදයෙනි. (4) සංකේතවාදයෙනි.

06. ඩොමීෂියන් අධිරාජ්‍යයාගේ පීඩන සමයේ ලියන ලද නව ගිවිසුමේ කෘතියකි,
(1) එළිදරව්ව (2) දානියෙල් (3) ජෝබ් (4) ධර්මදේශකයා

07. පැරණි ගිවිසුම තුළ ගිබියොන් කඳු ප්‍රදේශය ආශ්‍රිතව සිදු වූයේ,
(1) ආබ්‍රහම්තුමා දෙවියන් වහන්සේගෙන් සිය කැඳවීම ලැබීම යි.
(2) ජාකොබ්තුමා දෙවියන් වහන්සේ වෙනුවෙන් පූජාසනයක් පිහිටුවීම යි.
(3) දාවිත් රජතුමා පූජක සාමුවෙල් විසින් ආලේප කරනු ලැබීම යි.
(4) සලමොන් රජතුමා දෙවියන් වහන්සේට යාග පූජා කිරීම යි.

08. සාහිත්‍යමය ස්වරූප අතර සංකල්පනා දැකිය හැකි ප්‍රඥා සාහිත්‍යය ග්‍රන්ථය වන්නේ,
(1) උපදේශකයා ය. (2) ධර්මදේශකයා ය.
(3) හිතෝපදේශය ය. (4) සිරාක් ය.

09. ''පියාණෙනී, ඔවුන්ට කමා වුව මැනව. ඔවුන් කරන දෙය ඔවුහු නොදනිති.'' යි ජේසුස් වහන්සේ වදාළේ,
(1) කුරුසයේ එල්ලා සිටිය දී (2) අත්අඩංගුවට ගැනීමේ දී
(3) කාඩි පිළිගැන්වීමේ දී (4) වස්ත්‍ර බෙදා ගැනීමේ දී

Past Papers Wiki

10. ජේසුස් වහන්සේ සිය අපොස්තුළුවරුන් වෙත පවිකමා කිරීමේ බලය දානය කරනු ලැබුවේ..... සවස ය.
(1) මහ බ්‍රහස්පතින්දා (2) මහ සිකුරාදා
(3) පාස්කු ඉරුදින (4) ගොඩ් ඉරිදා

11. ජුදෙව්වන්ගේ නෑඹුල්එල ඔප්පු කිරීම සිදුකළේ,
(1) පාස්කු මංගල්‍යයේ දී ය. (2) පෙන්තකොස්ත මංගල්‍යයේ දී ය.
(3) කුඩාරම් මංගල්‍යයේ දී ය. (4) ගිවිසුම් කරඬුවේ මංගල්‍යයේ දී ය.

12. මුල් කිතුනුවන් ප්‍රාණපරිත්‍යාගීන් වීමට ශක්තිය ලැබුයේ,
(1) යහපත් දිවි පෙවෙතක් ගත කළ නිසා ය.
(2) ප්‍රඥාවෙන් පූර්ණ වූ නිසා ය.
(3) විශ්වාසය තුළ ජීවත් වූ නිසා ය.
(4) ශුද්ධාත්ම වරමින් පූර්ණ වූ නිසා ය.

13. පාවුලුතුමා විසින් කොරින්ති සංඝය පිහිටුවන ලද්දේ,
(1) පළමු ධර්මදූත චාරිකාවේ දී (2) රෝම ධර්මදූත චාරිකාවේ දී
(3) දෙවන ධර්මදූත චාරිකාවේ දී (4) තෙවන ධර්මදූත චාරිකාවේ දී

14. ''ඔබ ක්‍රිස්තුවරයාණෙනි..... මෙහි හිස්තැනට යෝග්‍ය පිළිතුර තෝරන්න.
(1) ශුද්ධාත්මයාණන්ගේ ආලෝකයාණෙනි ය.
(2) තෝරාගත් තැනැත්වහන්සේ ය.
(3) ස්වර්ගීය පියාණන්ගේ පුත්‍රයාණෙනි ය.
(4) ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෙනි ය.

15. පවිකරුවන් පාපයෙන් ඉවත්කර දෙවියන් වෙතට ගමන් කිරීමට සැලැස්වීමෙන් පෙන්වා දෙන්නේ සභාවේ,
(1) ඒකත්වය යි. (2) ශුද්ධත්වය යි.
(3) අපෝස්තලිකත්වය යි. (4) සාධාරණත්වය යි.

16. ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ අවධියේ මෙරට කිතුනුවන් මුහුණ පෑ ප්‍රධාන ම ගැටලුව වූයේ,
(1) කිසිඳු පූජකයෙකු නොමැති වීම. (2) සියලු ම පාසල්වල රෙපරමාදු දහම ඉගැන්වීම.
(3) දිව්‍ය පූජාව පැවැත්වීම තහනම් කිරීම. (4) පාසල් රජයට පවරා ගැනීම.

17. ''ශුද්ධ වූ සභාවේ ..... සඳහා අවංකව වෙහෙසීම හා වැයවීම අපගේ යුතුකම වේ.'' හිස්තැනට සුදුසු වරණය තෝරන්න.
(1) සංවර්ධනය. (2) එකමුතුකම. (3) අභිවෘද්ධිය. (4) සාමූහිකත්වය.

18. ලන්චියානෝ නුවර දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්යය සිදු වූ දේවස්ථානය කැප කර ඇත්තේ,
(1) ශු. ලෝරෙන්ස් මුනිතුමාට ය. (2) ශු. ලෙගොන්ෂියන් මුනිතුමාට ය.
(3) ශු. බෘනෝ මුනිතුමාට ය. (4) ශු. බොනවැන්චර් මුනිතුමාට ය.

19. ජුදා පාස්කු භෝජනයේ මූලික අංග ගණන වනුයේ,
(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි.

20. මුල් කිතුණු සංඝය තුළ ප්‍රේමය හා සේවය අතපසු කළ බවට ශුද්ධ වූ පාවුලුතුමාගෙන් චෝදනා ලබන සංඝය වන්නේ,
(1) එපීසිය යි. (2) ගලාතිය යි. (3) පිලිප්පිය යි. (4) කොරින්තිය යි.

21. දිව්‍ය භෝජනයට සහභාගී වීමට නම් පළමුව කළ යුත්තේ,
(1) ප්‍රේමයේ පනත තුළ ජීවත් වීම ය. (2) ප්‍රසාද නිධාන ලබා ගැනීම ය.
(3) ඉරුදින දිව්‍ය පූජාවට සහභාගී වීම ය. (4) දේව වචනය මෙනෙහි කිරීම ය.

22. පුරාණ ගිවිසුමේ යාග පැවැත්වීමේ පරමාර්ථයක් වන්නේ,
(1) පව්වලට වන්දි ගෙවීම ය. (2) දෙවිඳුන්ට ප්‍රශංසා කිරීමට ය.
(3) දෙවිඳුන් තුළ ජීවත් වීමට ය. (4) දෙවිඳුන් සොයා යාම ය.

23. මරියතුමියට තිබූ භක්තිය පදනම් කරගනිමින් 'මරිය තුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව' ආරම්භ කරන ලද්දේ,
(1) ශු. තෙරේසා මව්තුමිය ය. (2) ශු. මැක්සිමිලියම් කෝල්බේ මුනිතුමා ය.
(3) ශු. ජුසේවාස් පියතුමා ය. (4) ශු. II වන ජුවාම් පාවුලු මුනිතුමා ය.

24. දිළිඳුකම තුළ මාංශගතවෙමින් දිළිඳුන් වෙනුවෙන් කැපවූයේ,
(1) තෙරේසා මව්තුමිය ය. (2) අගෝස්තීනු මුනිතුමා ය.
(3) මැක්සිමිලියම් කෝල්බේ මුනිතුමා ය. (4) මයිකල් රුදිගු පියතුමා ය.

25. අපගේ විශ්වාසය පෝෂණය කරගෙන වර්ධනය කර ගැනීමට අපට ආරාධනා කරන්නේ,
(1) පළමු පනත ය. (2) දෙවන පනත ය.
(3) තෙවන පනත ය. (4) හතරවන පනත ය.

26. සක්‍රමේන්තු අතර පොරොන්දු දී ලබා ගන්නා සක්‍රමේන්තු යුගලයක් වන්නේ,
(1) පූජකවරය හා පාපොච්චාරණය.
(2) ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපය
(3) ආශීර්වාදකාර බන්ධනය හා පාපොච්චාරණය
(4) රෝගීන් ආලේපනය හා පූජකවරය

27. බෞතිස්ම ස්නාපනයේ දී දෙවි සමිඳාණන් වහන්සේගේ නාමය මගින් අදාළ පුද්ගලයා,
(1) විශේෂ වේ. (2) ගෞරවයට පත් වේ.
(3) ශුද්ධවත් වේ. (4) ආදර්ශවත් වේ.

28. හතරවන දේව පනත මගින් පෙන්වා දෙන්නේ,
(1) දෙවියන් වහන්සේට ගෞරව කරන ආකාරය පිළිබඳව ය.
(2) අසල්වැසියාට දක්වන දයාව පිළිබඳව ය.
(3) පාප මිත්‍ර ඇසුරේ ආදීනව පිළිබඳව ය.
(4) දෙමාපිය වැඩිහිටියන්ට සැළකීම පිළිබඳව ය.

29. සියදිවි නසා ගැනීම අසල්වැසියාට විරුද්ධ පාපයක් වන්නේ,
(1) අසල්වැසියා නිතරම අපට අවශ්‍ය වන නිසා ය.
(2) අසල්වැසියා ද දේව ස්වරූපය හා සමානකම දරන නිසා ය.
(3) අසල්වැසියාට ප්‍රතිප්‍රේමය දැක්විය යුතු නිසා ය.
(4) අසල්වැසියා සමඟ පැවති සබඳතා අපම අවසන් කරන නිසා ය.

30. ''සෑම ආකාරයකම ආශාවන්ගෙන් මිදීම තුළින් මිනිසාට ..... ළඟා කරගත හැක.'' හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
(1) සතුට (2) සහනය (3) උදාරත්වය (4) තෘප්තිය

31. සෑම කිතුනුවෙක් ම මර්යදාව තුළ ආදර්ශමත් ව දිවි ගෙවීමට පොරොන්දු වන දේව ප්‍රසාද නිධානය වන්නේ,
(1) අභිවෘද්ධි ආලේපය. (2) ප්‍රසාද ස්නාපනය.
(3) පාපොච්චාරණය. (4) රෝගීන් ආලේපය.

32. විශ්වාසයේ සත්‍යයා සඳහා දෙනු ලබන උතුම්ම සාක්ෂිය වන්නේ,
(1) ප්‍රාණපරිත්‍යාගී වීමයි. (2) ප්‍රේම කිරීමයි.
(3) ආදර්ශමත්වීමයි. (4) කැපවීමයි.

33. ජනතාව උදෙසා වැටුපක් නොලබා කරනු ලබන සේවාව යන්න අර්ථදැක්වෙන ග්‍රීක වචන කාණ්ඩය වන්නේ,

(1) ලිටර්ජි, ලිටුර්ජියා (2) අල්ෆා, ඔමෙගා

(3) ලිටර්ජි, ඒර්ගෝන් (4) ලාඕස්, ඒර්ගෝන්

34. පළමු, දෙවන හා තෙවන වසරවල දී ඉරුදින ජනවන්දනාවට භාවිත වන සුවිශේෂයන් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ලූක්, මාක්, මතෙව්, සුභාරංචි (2) මාක්, මතෙව්, ලූක්, සුභාරංචි

(3) මතෙව්, මාක්, ලූක්, සුභාරංචි (4) මාක්, ලූක්, මතෙව්, සුභාරංචි

35. දිව්‍ය පූජාවේ සිදුකරනු ලබන ප්‍රධාන පිළිවෙත් පිළිබඳව පහත දැක්වේ. ඒවා සිදුකරන ආකාරය අනුව අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,

A - දේව වාක්‍ය පිළිවෙත.

B - ස්තෝත්‍ර යාගික පිළිවෙත.

C - පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත.

D - ධර්මදූත කාර්යය සඳහා පිටත්කර යැවීමේ පිළිවෙත.

E - ආරම්භක පිළිවෙත.

(1) ABCDE (2) EACBD (3) BDCEA (4) CABED

36. දිව්‍ය පූජාව තුළ, පුත්‍රයාණන් වහන්සේ මගින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ සහභාගීකමෙන් කෙරෙන යාච්ඤාවකි,

(1) ස්තෝත්‍ර යාගික යැදුම. (2) මුලසුනේ යැදුම.

(3) ස්වාමීවාක් ආරාධනාව. (4) පොදු යැදුම.

37. එකමුතුකම තේමාව කරගත් ක්‍රිස්තුන් වහන්සේ විසින් සිදුකළ යාච්ඤාවකි,

(1) උත්තම පූජක යාච්ඤාව (2) මල් උයනේ යාච්ඤාව

(3) ස්වාමීවාක් ආරාධනාව (4) පරමණ්ඩල යාච්ඤාව

38. ඉතිහාසයේ සහා බෙදීම් අධ්‍යයනය කරන විට එයට හේතු වූ මූලික සාධකය වන්නේ,

(1) විවිධ පුද්ගලයන්ගේ බලපෑම් හා ඇති වූ වේදභේද යි.

(2) පුද්ගල බද්ධව ක්‍රියාකිරීම හා නුසුදුසු තීරණ ගැනීම යි.

(3) අධිරාජ්‍යයාගේ අනිසි බලපෑම් හා දේශපාලනීකරණය යි.

(4) මනුෂ්‍යයන්ගේ දුර්වලකම් හා පව්කාරී ස්වභාවය යි.

39. ''මා යාච්ඤා කරන අතර ඔබ මෙහි සිටින්න.'' මෙළෙස ජේසුස් වහන්සේ ප්‍රකාශ කරනු ලැබුයේ,

(1) උත්තම පූජක යාච්ඤාව අවසන් කළ අවස්ථාවේ දී ය.

(2) ගෙත්සෙමෙනිය වෙත පැමිණි අවස්ථාවේ දී ය.

(3) ප්‍රාතිහාර්ය සිදුකරන අවස්ථාවේ දී ය.

(4) යාච්ඤාව පිණිස කන්දට නැගුණු අවස්ථාවේ දී ය.

40. මල් උයනේ යාච්ඤාවේ අඩංගු ප්‍රධාන කරුණු කිහිපයක් පහත දැක්වේ. ඒවා අතරින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

A - යාච්ඤාව තුළ ජේසුස් වහන්සේ සියල්ල ජයගත් බවය.

B - ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය යි.

C - ජේසුස් වහන්සේ දුර්පරීක්ෂ ජයගත් බව යි.

D - ජේසුස් වනන්සේගේ සැබෑ මනුෂ්‍යත්වය යි.

E - දෙවියන් වහන්සේ හා ක්‍රිස්තුන් වහන්සේ අතර ඇති සම්බන්ධතාවය යි.

(1) ABD (2) CDE (3) BDE (4) BCD

(ලකුණු 1 × 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

කතෝලික ධර්මය II

කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

---

01. (1) වෙනත් හසුන් ලියා ඇති අපොස්තුළුවරුන් දෙදෙනක් නම් කරන්න.

(2) එළිදරව් සාහිත්‍යයට අයත් ආරුඪ නමයකින් ඉදිරිපත් කර ඇති කෘති දෙක නම් කරන්න.

(3) ජේසුස් වහන්සේ උකුත්වීමෙන් - අනතුරුව අරමාතියේ ජෝශප් විසිනි සිදුකරන ලද කාර්යයන් දෙක ලියන්න.

(4) බැඳීමට හා මිදීමට බලය ලත් පේදුරු තුමාට ශුද්ධවු සභාව තුළ හිමි වූ විශේෂ බලතල දෙක නම් කරන්න.

(5) දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් දෙකක් ලියන්න.

(6) පුරාණ ගිවිසුමේ යාග පූජා අතර සත්ත්ව පූජා වැදගත් වීමට හේතු වූ කරුණු දෙක ලියන්න.

(7) බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් දෙක නම් කරන්න.

(8) මර්යදාව තුළ දිවි ගෙවීමට අපට ආරාධනා කරන පනත් දෙක ලියා දක්වන්න.

(9) ශුද්ධ වූ සතියේ ප්‍රධාන ජනවන්දනා දින දෙකක් නම් කරන්න.

(10) කිතුනු සභා ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් දෙක නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

02. (1) දේව අනාවරණයේ මූලාශ්‍ර දෙක නම් කරන්න.

(2) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ සැකැස්මෙහි අඩංගු කරුණු තුනක් ලියා දක්වන්න.

(3) දේව වචනය ඔබගේ ජීවිතයට ආලෝකයක් කර ගැනීමට ඔබ ක්‍රියා කරන්නේ කෙසේදැයි කරුණු පහකින් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. (1) ක්‍රිස්තුන් වහන්සේ උකුත් වූ අවස්ථාවේ පරිසරයේ සිදු වූ වෙනස්වීම් දෙකක් ලියන්න.

(2) උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ ශ්‍රාවකයන්ට දර්ශනය වූ අවස්ථා තුනක් ලියන්න.

(3) පාසල් සමාජය තුළ ක්‍රිස්තු ශ්‍රාවකයෙක් ලෙස උන්වහන්සේට සාක්ෂි දැරීමට ඔබට කළ හැකි කාර්යයන් පහක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

Past Papers Wiki

04. (1) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට සූදානම් වන ආකාර දෙක ලියන්න.

(2) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු තුනක් නම් කරන්න.

(3) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට පංගුකාරවන ඔබ ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග පහක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05. (1) පෞද්ගලික දේපළ පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව අපට නියෝග කරන පනත් දෙක ලියා දක්වන්න.

(2) ඉහත දැක්වෙන පනත්වලට අනුව දේව රාජ්‍යය උරුම කර නොගන්නා කණ්ඩායම් තුනක් නම් කරන්න.

(3) ''දෙවියන් වහන්සේ මිනිසාට දේපල ලබා දී ඇත්තේ මිනිසාට දේවය කිරීමට ය. එබැවින් කිතුනුවකු ලෙස දේපල පරිහරණය කළ යුතු ආකාරය කරුණු පහකින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06. (1) දිව්‍ය පූජාව තුළ ආරම්භයේ දක්නට ලැබෙන ගෞරවයේ සංකේත දෙකක් ලියන්න.

(2) දිව්‍ය පූජාවේ දක්නට ලැබෙන මුලසුනේ යැදුම් තුන නම් කරන්න.

(3) ජනවන්දනා මෙහෙයන්වලට අර්ථවත්ව සහභාගී වීම සඳහා ඔබ කරන යෝජනා පහක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) පෙන්තකොස්තය

(2) ශ්‍රී ලාංකික කතෝලික සභාව

(3) යහපත් කිතුණු පවුල

(4) මිනිස් දිවියේ අගය

(ලකුණු 2 × 5 = 10)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

පිළිතුරු පත්‍රය - I පත්‍රය

1 -(3)	2 -(1)	3 -(2)	4 -(4)	5 -(3)	6 -(1)	7 -(4)	8 -(2)	9 -(1)	10 -(3)
11-(2)	12 -(4)	13 -(3)	14 -(4)	15 -(2)	16 -(1)	17 -(3)	18 -(2)	19 -(3)	20 -(4)
21-(1)	22 -(1)	23 -(2)	24 -(4)	25 -(1)	26 -(2)	27 -(3)	28 -(4)	29 -(4)	30 -(3)
31-(2)	32 -(1)	33 -(4)	34 -(3)	35 -(2)	36 -(1)	37 -(1)	38 -(4)	39 -(2)	40 -(3)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

II පත්‍රය

01. (1) පේදුරුතුමා, ජාකොබ්තුමා, ජොහාන් තුමා, ජුද්තුමා

(2) දානියෙල්, එළිදරව්ව

(3) පිලාත් වෙත ගොස් මෘත දේහය ඉල්ලා සිටීම. / ජේසුතුමාගේ මාතෘ ශරීරය කුරුසියෙන් බෑම. / භූමදාන කටයුතු සූදානම් කිරීම.

(4) පව්කමා කිරීමට, විශ්වාසය හා සදාචාරය පිළිබඳ ඉගැන්වීමට.

(5) පූප කැඩීම, ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය, නව පාස්කු මංගල්‍යය, ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගිකම

(6) සත්වයාගේ රුධිරය තුළ ජීවිතය අන්තර්ගත වීම. / ජීවිතය දෙවියන් වහන්සේට අයිති වීම.

(7) ඉච්ඡාභංගත්වය, අනුමානය

(8) 6 වන පණත - කාමමිථ්‍යාචාරය නොකරව / 9 වන පණත - පරදාර ආලය නොකරව

(9) ගොබ් ඉරුදින, මහබ්‍රහස්පතින්දා, මහ සිකුරාදා , ආලේලුයියා සෙනසුරාදා

(10) පිළිගත් කිතුණු සභා, මූලධර්ම වාදී සභා

02. (1) ශු. බයිබලය, ජීවන සභා සම්ප්‍රදාය

(2) ධර්මදූත සේවයට සූදානම / ජෙරුසලමේ සාක්ෂි දැරීම. / ජුදයේ හා සමාරයේ සාක්ෂි දැරීම. / ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූත සේවය.

(3) යාච්ඤාව සඳහා දේව වචනය භාවිත කිරීම. / එදිනෙදා පැමිණෙන ප්‍රශ්න අභියෝග හමුවේ දේව වචනය තුළ පිළිතුරු සෙවීම. / ශුද්ධ බයිබලයේ චරිත වලින් ආදර්ශ ලබා ගැනීම යන ආදී කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න.

03. (1) හිරු අඳුරුවීම, රටපුරා අන්ධකාරයක් පහළ වීම.

(2) පාස්කු ඉරුදින එමම්ාවුස් බලා ගිය ගෝලයන්ට / පාස්කු ඉරුදින සවස / තෝමස් අපෝස්තුළුවරයාට

(3) පාසල් සමාජය තුළ සහයෝගයෙන් කටයුතු කිරීම පන්ති කාමරය තුළ එදිනෙදා දේවචනය ප්‍රදර්ශනය කිරීම. / පාසල් තුළ නොමඟට ගිය අයවලුන් නිසි මඟට යොමු කරවීම. / කොන් වූ යහළුවන් පිළිගැවීම. / පරිත්‍යාගශීලි වීම යන ආදී කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න.

04. (1) ආත්මික සූදානම/ ශාරීරික සූදානම

(2) මෙල්කිසෙදෙක්ගේ යාගය / මන්නා භෝජනය / නුමුහුන් පූප අනුභවය හා කුසලානෙන් පානය කිරීම. / පූප වැඩිකිරීමේ ප්‍රාතිහාර්ය

(3) වරදට සමාව දීම. / පාරාර්ථ කාමීවීම. / සැමට එකසේ සැලසීම. / අන් අය වෙනුවෙන් කාලය ශ්‍රමය කැප කිරීම. / සමගි සන්ධානයේ සක්‍රමේන්තුව තුළ ජීවත් වීම වැනි කරුණු සලකාබලා ලකුණු ලබා දෙන්න.

05. (1) සොරකම් නොකරව, අන් වස්තු ආශා නොකරව

(2) සොරුන්, ලෝබයන්, නින්දාකරන්නන්, කොල්ලකන්නන්, බේබද්දන්, ගසාකන්නන්

(3) පොදු දේපල විනාශ නොකිරීම. / අන් අයාගේ දේපල විනාශ නොකිරීම. / අනුන්ගෙන් ලබාගත් දෙය හා අනුන් සතු දෙක සම්බ වූ විට ආපසු බාර දීම. / අප සතු දේ දිළිඳුන් සමඟ බෙදා ගැනීම.

06. (1) නමස්කාරය, පූජාසනය සිපාචාරය, සුවඳ දුම්, දල්වන පද පහන්

(2) පොදු යැදුම, පඬුරුමත යැදුම, බොදුනෙත් පසු යැදුම

(3) දිව්‍ය පූජාවේ කියවීම්වලට සූදානමකින් යුතුව සම්බන්ධ වීම. / අන් අයට බාධාවක් නොවන ලෙස ජන වන්දනාවට සහභාගීවීම. / බාහිර අභ්‍යන්තර සූදානමකින් යුතුව සහභාගී වීම. වැනි කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න.

07. (1) පිටු අංක 23 - 25

(2) පියු අංක 37 - 43

(3) පිටු අංක 75 - 78

(4) පිටු අංක 81 - 87

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank